ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයට අනුබද්ධිත ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි.
Sri Lanka Cultural Education Centre attached to the Consulate General of Sri Lanka, Dubai
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංක E/A.D./ද.ප./ලි/001

2017 මාර්තු 23 යොමු අංකය: 1718-031

17 වන සංවත්සර උත්සවය - මුල්‍ය ප්‍රතිපාදන සඳහා අනුග්‍රහය

අප දහම් පාසලේ 17 වන සංවත්සර උත්සවය අප්‍රේල් 20 වැනිදා, සිකුරාදා ඩුබායි හි Springdales පාසල් රංගන ශාලාවේ පැවැත්වෙන අතර එම උත්සවය සඳහා ශාලාව, දරුවන් හට ලබාදෙන කුසලාන, ත්‍යාග ආදිය සඳහා විශාල මුදලක් වැයවන බව ඔබ සියලු දෙනා ඉතා හොඳින් දන්නවා ඇත. මෙම ප්‍රතිපාදන ලබාගැනීම සඳහා දෙමාපියන් වන ඔබ සැමට ඔබ දන්නා වෙළඳ ආයතන මගින් මුල්‍යමය අනුග්‍රහය ලබා දිය හැකි වන අතර දෙමාපියන් වශයෙන් ඔබට හෝ ඔබගේ මිතුරන් සමග සම්බන්ධ වී මෙම උත්සවය සඳහා දායක විය හැකි බවද අවධාරණය කරමු.

මෙම උත්සවය සැමරීම සඳහා මුද්‍රණය කරන සංවත්සර සමරු කලාපයේ පිටු වෙන්කර ගැනීමෙන් ඔබට මෙම දායකත්වයන් ලබා දිය හැකිවන අතර ඒ පිලිබඳ විස්තර ලබා ගැනීම සඳහා:
මධුරි කරුණාරත්න මහත්මිය අමතන්න: 056 9715303

ඔබගෙන් ලැබෙන මෙම අනුග්‍රහය ඔබගේ දරුවන් සඳහාම වන බව අවධාරණය කරන අතර එසේ ලබා දෙන අනුග්‍රහයන් සඳහා අප ඉතාමත් ස්තුතිවන්ත වන බවද සඳහන් කරමු.

ස්තුතියි

සංවිධායක මණ්ඩලය

Sri Lanka Consulate General Office, No. 2, Street 322-B, Al Hudaiba, Dubai, UAE. Postal: PO Box 51528, Dubai, UAE.
TP. +971 4 3986535, Fax: +971 4 3984687, E Mail: dahampasaladubai@gmail.com, Web: http://www.dhahampasala.org